සැ. යු. -මෙවර පළවන ගැසට් පත්‍රයේ II කොටසේ ජූරි සභික නාමවලියක් පළ වේ.
2010.01.01 දින පළ වූ අංක 1,635 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,636 - 2010 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2010.01.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 50 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 50 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 52 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


49- B 80082—3,350 (2010/01)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 02

DIRF/RECT/86(X)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත සඳහන් කෙඩෙට් නිලධාරි/නිලධාරිනිය 2009 මැයි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

සී/56743 කෙඩෙට් නිලධාරි සිංහ විදුරගේ රුවිර සෝමවීර
සී/56747 කෙඩෙට් නිලධාරිනි ශානිකා ජීවන්ති හලංගොඩ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

01-302

---

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2009 දෙසැම්බර් මස 14 වැනි දින,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම් පත් අංකය* | | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|---|
| (01)<br>41222 | 01. | කුමාරවඩු අරුණ විරාජ් මයා,<br>අංක 505, දෙවන අදියර, | තිරාහන්දි සුනිල් කාන්ති හෙවත්<br>රණසිංහ සුනිල් කාන්ති මිය, |

| ඉල්ලුම් පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| | හර්මන් වත්ත,<br>දොඩංගොඩ | රොබට් සොයිසා පාර,<br>වලගෙදර, බලපිටිය |
| | 02. ජේයාහන්දි ජේමවතී මිය,<br>රොබට් සොයිසා පාර,<br>වලගෙදර, බලපිටිය | |
| (2)<br>41246 | දොන් විල්ෆ්‍රඩ් විජේනායක මයා (මියගිය)<br>වෙනුවෙන්<br>උරුමකරුවන්<br>01. වාසල මුදියන්සේලාගේ ලීලා කුමාරි<br>විජේනායක මිය,<br>02. ලියනආරච්චිගේ දොන් සාලිය විජේනායක මයා,<br>03. තමරි බන්දුමාලා විජේනායක මිය,<br>අංක 1/19, විජය සෙවන,<br>මැදවල පාර, පූජාපිටිය | ජනක සමරවික්‍රම මයා,<br>අංක 5/1, ගංගා මාවත,<br>පොල්ගොල්ල |
| (3)<br>41298 | කොම්බු කමණි ප්‍රියන්ති මිය,<br>කිරවලාවත්ත පාර,<br>වැලිකන්ද,<br>අහුන්ගල්ල | පිටියගේ කරුණාවතී මිය,<br>වැලිකන්ද,<br>අහුන්ගල්ල |
| (04)<br>41354 | 01. රත්මුණිලාගේ ශ්‍රියා රත්මුණි මිය,<br>ආර්. එම්. ඩී. රාජපක්ෂ මයා බාරේ,<br>කොළඹ පාර,<br>රෝහල හන්දිය,<br>රත්නපුර. | මාණාභරණ අර්සකුලසූරිය මයා,<br>අංක 359, පොලීසිය අසල,<br>ඇහැලියගොඩ. |
| | (2) කනුන්ගල්ල මනන්නලාගේ ලුවිනා<br>හෙවත් රංජනී ප්‍රේමලතා මිය,<br>අංක 558ඒ, පහළගම,<br>එල්ලාවල. | |
| (05)<br>4143 | හේනකරාලලාගේ කුමාරසිරි ගුණවර්ධන මයා,<br>ගනේපල්ල,<br>තැලිගම | ගල්කඩුව රාලලාගේ රංජිත් විජේරත්න මයා,<br>ගනේපල්ල පාර,<br>තුංකිඳ, තැලිගම |
| (06)<br>41444 | සිංගප්පුලි ආරච්චිගේ ලක්ෂ්මන් පෙරේරා<br>මයා වෙනුවෙන්,<br>ඇටෝර්නි බලකරු,<br>මහපටුනගේ චමිලි ප්‍රදීප් කුමාර්<br>විජේසේකර මයා,<br>අංක 129/1, සරණ පාර,<br>පන්නිපිටිය | එගොඩහේවගේ කුසලානි මිය,<br>අංක 6-5/2,<br>මහජන මාවත,<br>ඔරුවල<br>අතුරුගිරිය |
| (07)<br>41450 | කුමාරගේ රවීන්ද්‍ර රංගජීව මයා,<br>අංක 722/24/1, ජයවර්ධන මාවත,<br>අභයපුර,<br>අතුරුගිරිය | ඉන්දිරා නන්දනී වීරසිංහ මිය,<br>අංක 29, ද මෙල්වත්ත පාර,<br>කොස්වත්ත,<br>නාවල |
| (08)<br>41451 | හෙන්දාදුර ආලවතී ද සිල්වා මිය,<br>අංක 41, විජය මාවත,<br>රන්දොඹේ,<br>අම්බලන්ගොඩ. | ගංගේ ඉෂාර දිල්ශාන් මයා,<br>අංක 144/2, පෝරඹ,<br>අම්බලන්ගොඩ |

**(61 වැනි අධිකාරය වූ) ළමයින් දරුකමට හදාවඩා ගැනීමේ ආඥාපනත**

ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ 3 වැනි වගන්තියේ (5 ආ(1) වැනි උපවගන්තිය යටතේ ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යවරිය විසින් සම්පාදිත නියෝගය.

සුමේධා ජී. ජයසේන,
ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමිය.

2009 දෙසැම්බර් මස 21 වැනි දින,
නාවල දී ය.

නියෝගය

3(5අ)(ආ)(1) වැනි වගන්තියේ සඳහන් අයදුම්කරුවන් වෙනුවෙන් 2010 ලිත් වර්ෂය සඳහා සියලු අධිකරණ විසින් නිකුත් කළ හැකි ළමයින් දරුකමට හදාවඩා ගැනීමේ ආඥා සංඛ්‍යාව එකසිය පනහක් (150) විය යුතුය.

01-306

---

**දැන්වීමයි**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලයලත් නිමල් ජයසිරි වීරසේකර මහතාගේ නොතාරිස් බලපත්‍ර 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 21(2) වගන්තිය යටතේ ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් 2009.06.08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමත්‍යාංශය.

2009 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

01-307

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද අංක 3985 හා 2007.03.09 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කෑගල්ලේ, මඩිගෙ මුහන්දිරම්ලාගේ මොහොමඩ් හනීෆා මොහොමඩ් අබුතාහිර් යන අය විසින් පැහැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු මස 31 වැනි දිනට, ඉහත කී අංක 3985 දරන උකස් බැඳුම්කරය මත, එකී මඩිගෙ මුහන්දිරම්ලාගේ මොහොමඩ් හනීෆා මොහොමඩ් අබුතාහිර් යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් දහනව ලක්ෂ හැත්තෑඑක්දහස් හැත්තෑ තුනකුත් ශත පහක (රු. 19,71,073.05) මුදලක් සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහහතර ලක්ෂ හැත්තෑතුන් දහස් දෙසිය අනූදෙකකුත් ශත හැට නවයක් (රු. 14,73,292.69) සඳහා වර්ෂයකට සියයට විසිහතකුත් දශම පහ (27.5%) බැගින් පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහනවලක්ෂ හැත්තෑඑක්දහස් හැත්තෑ තුනකුත් ශත පහක (රු. 19,71,073.05) මුදල සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහහතර ලක්ෂ හැත්තෑතුන් දහස් දෙසිය අනූදෙකකුත් ශත හැට නවයක් (රු. 14,73,292.69) සඳහා වර්ෂයකට සියයට විසිහතකුත් දශම පහ (27.5%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි

වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3985 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 3985 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල මාවත පත්තුවේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල සුළු නගර සභා සීමාව ඇතුළත, ඕලගම පිහිටි මාලියැද්දේ කුඹුර දැනට වත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දොරු පී. කපුගීකියනගේ විසින් මැන සකස් කළ අංක 2536 හා 1975.07.30 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3 ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 6 සහ සුළු නගර සභා කාණුව ද, නැගෙනහිරට : ලොට් අංක 4 ද, දකුණට : මහපාර සහ බස්නාහිරට : ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත පර්චස් දෙකකුත් දශම හතයි හයයි හතරක් (අ. 0, රූ. 0, ප. 2.764) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

01-310

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ඩී. වී. වනසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 486 හා 2006.10.18 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, පී. ජී. මාටින් වන්ඩර්වර්ල්ඩ් යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස කොළඹ ව්‍යාපාරය කරගෙන යන නුගේගොඩ, පියදිගමගේ හරිස්චන්ද්‍ර නිමලසිරි සහ ක්‍රිස්ටබෙල් ලලිතා නිමලසිරි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු මස 31 වැනි දිනට, ඉහත කී අංක 486 දරන උකස් බැඳුම්කරය මත, එකී පියදිගමගේ හරිස්චන්ද්‍ර නිමලසිරි සහ ක්‍රිස්ටබෙල් ලලිතා නිමලසිරි යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැටහත්ලක්ෂ පහළොස්දහස් තුන්සිය දහනවයක (රු. 67,15,319) මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස්අටලක්ෂ තිස්තුන්දහස් තුන්සිය විස්පහක (රු. 58,33,325) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනෙන් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හැටහත්ලක්ෂ පහළොස්දහස් තුන්සිය දහනවයක (රු. 67,15,319) මුදලක් සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස්අටලක්ෂ තිස්තුන්දහස් තුන්සිය විස්පහක (රු. 58,33,325) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනෙන් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ ඊට හිමි මාර්ග අයිතිය ද සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 486 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ ඊට හිමි මාර්ග අයිතිය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 486 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නරගසභා සීමාව ඇතුළත ගංගොඩවිල, මිරිහාන පාරේ පිහිටි පැලන්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සකස් කල අංක 9539 හා 1991.01.04 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක “ඒ2බී2” ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම් උතුරට : පාර සහ ලොට් “ඒ2බී” ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. කන්නංගර විසින් මැන සාදන ලද අංක 307 හා 1989.06.27 දින දරන පිඹුරේ ලොට් “ඒ 2සී ” ද, අංක 3630 දරන පිඹුරේ (වරිපනම් අංක 33 දරන) ලොට් අංක 2ඒ ද, දකුණට : වරිපනම් අංක 23/18 සහ 23/19 දරන පරිශ්‍ර ද අංක 307 දරන පිඹුරේ ලොට් ඒ2සී, සහ අංක 3660 දරන පිඹුරේ (වරිපනම් අංක 33 දරන) ලොට් 2ඒ ද, බස්නාහිරට : වරිපනම් අංක 23/18 සහ 23/19 දරන පරිශ්‍ර හා ලොට් අංක ඒ2බී1ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 9539 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි එකකුත් දශම තුනයි හතක් (අ. 0, රූ. 0, ප. 21.37) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි, මිරිහාන පාර වරිපනම් අංක 35 (කොටසක්) දරන නිවාසය සහ එහි පිහිටි සියලු ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරසභා සීමාව ඇතුළත ගංගොඩවිල, මිරිහාන පාරේ පිහිටි පැලන්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සකස් කල අංක 9539 හා 1991.01.04 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක "ඒ2බී1" ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම් උතුරට : පාර සහ එකී අංක 307 දරන පිඹුරේ ලොට් ඒ2ඒ ද, නැගෙනහිරට : පාර සහ ලොට් ඒ2බී2 ද, දකුණට : වරිපනම් අංක 23/17 හා 23/18 දරන පරිශ්‍ර සහ ඉහත කී අංක 9539 දරන පිඹුරේ ලොට් ඒ2බී2 ද, බස්නාහිරට : වරිපනම් අංක 23/17 හා 23/18 දරන පරිශ්‍ර සහ ඉහත කී අංක 307 දරන පිඹුරේ ලොට් ඒ2ඒ ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 9539 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි, මිරිහාන පාර වරිපනම් අංක 35 (කොටසක්) දරන නිවස සහ එහි පිහිටි සියලු ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට බලයලත් මිනින්දෝරු එච්. දොන් ඩේවිඩ් විසින් මැන සකස් කළ අංක 3845 හා 1946.04.20 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් ඊ ලෙස ලකුණු කළ බිම් කට්ටිය තුළින්, මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත්ය.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරි.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-309/1

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. යූ, කැප්පෙටිපොල විසින් ලියා සහතික කරන ලද අංක 23384 හා 2005 පෙබරවාරි මස 03 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, මහනුවර, හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර උපතිස්ස වෙලගෙදර, හේමසිංහ නවරත්න සිටුබණ්ඩාරගේ චන්ද්‍රා කුමාරි වෙලගෙදර, හේරත් මුදියන්සේලගේ වෙලගෙදර යුගේශ්වර වෙලගෙදර, හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර රසික සුනෙත් වෙලගෙදර, හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර මහානාග වෙලගෙදර සහ හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර ගාමිණී වෙලගෙදර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු මස 31 වැනි දිනට, ඉහත කී අංක 23384 දරන උකස් බැඳුම්කරය මත එකී හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර උපතිස්ස වෙලගෙදර, හේමසිංහ නවරත්න සිටුබණ්ඩාරගේ චන්ද්‍රා කුමාරි වෙලගෙදර, හේරත් මුදියන්සේලගේ වෙලගෙදර යුගේශ්වර වෙලගෙදර, හේරත් මුදියන්සේලාගේ වෙලෙදර රසික සුනෙත් වෙලගෙදර, හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර මහානාග වෙලගෙදර සහ හේරත් මුදියන්සේලාගේ වෙලගෙදර ගාමිණී වෙලගෙදර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තුන්කෝටි අසූපන් ලක්ෂ හැත්තෑදහස් තුන්සිය විසිඅටකුත් ශත හතලිස් පහක (රු. 3,85,70,328.45) මුදලක් සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්කෝටි හැත්තෑහත් ලක්ෂ පනස් දෙදහස් පන්සිය පණස්තුනකුත් ශත හැත්තෑවක (රු. 3,77,52,553.70) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩකරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යයක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වර්ෂික අනුපාතිකය මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්කෝටි අසූපන් ලක්ෂ හැත්තෑදහස් තුන්සිය විසිඅටකුත් ශත හතලිස් පහක (රු. 3,85,70,328.45) මුදල සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්කෝටි හැත්තෑහත් ලක්ෂ පනස් දෙදහස් පන්සිය පණස්තුනකුත් ශත හැත්තෑවක (රු. 3,77,52,553.70) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩකරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යයක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම් හා පරිශ්‍ර විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23384 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම් හා පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 23384 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි මස 30 වැනි දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු මස 31 වැනි දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට්" සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නැමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් මස 30 වැනි දින සිට 2004 නොවැම්බර් මස 15 වැනි දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කල බෙදා වෙන්කල බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ජයනුදීන් සහ තවත් අය හිමිකම් කියන මස්ගොල්ල වත්ත, පී. ජී. රන්කිරා සහ තවත් අය හිමිකම් කියන "වහුගෙතැන්න" කුඹුරද රාමලිංගම් හිමිකම් කියන වබුගෙටින් වත්ත ද, නැගෙනහිරට : පී. ජී. රන්කිරා සහ තවත් අය හිමිකම් කියන වහුගෙතැන්න කුඹුර, වෙලේ අඩිපාර (field path) රාමලිංගම් හිමිකම් කියන වහුගෙතැන්න වත්ත,

පී. ජී. රන්කිරා හිමිකම් කියන වහුගෙතැන්න කුඹුර, පී. ජී. රන්කිරා හිමිකම් කියන උඩගෙදරවත්ත, ඉහත කී පිඹුරේ ලොට් අංක 5 සහ 3 ද, දකුණට : අලවතුගොඩ අන්කුඹුර ප්‍රධාන පාර දක්වා යන ප්‍රාදේශීය සභා පාර සහ එකී පිඹුරේ ලොට් අංක 3 සහ 2 වෙන්වන වතු පාර ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් අංක 2 සහ 3 වෙන්වන වතුපාර, ජයනුදීන් සහ තවත් අය හිමිකම් කියන ඔට්සන් වත්ත සහ මස්ගොල්ල වත්ත, වෙන්වන වතු පාර ද යන මායිම් ඇතුළත ඉහත කී පිඹුර ප්‍රකාර අක්කර හැට දෙකකුත් රූඩ් තුනකුත් පර්චස් තිස් හතක් (අ. 62, රූ. 02, පර්. 37) *නොහොත්* හෙක්ටයාර් 25.4683 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට් සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 03 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් අංක 01 බිම් කට්ටිය වෙන්වන වතු පාර ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 01 සහ 05 වෙන්වන වතුපාර හා විලන විහාරස්ථානය හිමිකම් කියන විලන පන්සල්වත්ත ද, දකුණට : එකී පිඹුරේ ලොට් අංක 08 වෙන් වන ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් අංක 02 වෙන් වන අගල සහ එකී පිඹුරේ ලොට් අංක 01 වෙන් වන වතු පාර ද, යන මායිම් ඇතුළත එකී පිඹුර ප්‍රකාර අක්කර දහසයකුත් රූඩ් එකකුත් පර්චස් විසි දෙකක් (අ.16, රූ.01, පර්. 22) *නොහොත්* හෙක්ටයාර් 6.6331 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ ගස කොළ, වැවිලි හා එහි පිහිටි වෙනත් සියලු දේ.

03. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට් සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 05 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් අංක 01 වෙන්වන ප්‍රාදේශීය සභා පාර සහ කාලියදාස හිමිකම් කියන අන්ගෙවත්ත ඉඩම ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 07 වෙන්වන ප්‍රාදේශීය සභා පාර, රාමලිංගම් හිමිකම් කියන වහුගේතැන්න වත්ත, පී. ජී. ටිකිදුරයා හිමිකම් කියන අන්ගෙවත්ත, ධර්මපාල සහ තවත් අය හිමිකම් කියන අන්ගෙකුඹුර සහ ජයසිංහ හා විලන විහාරස්ථානය හිමිකම් කියන විලනවත්ත ද, දකුණට : ධර්මපාල සහ තවත් අය හිමිකම් කියන අන්ගෙකුඹුර වෙන් වන ඇළ, කාලියදාස හිමිකම් කියන අන්ගෙවත්ත ඉඩම, සමිඳු සහ තවත් අය හිමිකම් කියන අඳපොලවත්ත ද, ජයසිංහ හිමිකම් කියන අඳපොලවත්ත ප්‍රාදේශීය සභා පාර, විලන විහාරස්ථානයේ විලන පන්සල් වත්ත සහ ප්‍රාදේශීය සභා පාර, බස්නාහිරට, උතුරු-බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර සහ බස්නාහිරට සහ උතුරු-බස්නාහිරට එකී පිඹුරේ ලොට් අංක 01 සහ 03 වෙන් වන ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් ඇතුළත ඉහත කී පිඹුර ප්‍රකාර අක්කර දොළහකුත් පර්චස් එකක් (අ.12, රූඩ්.0, පර්.01) *නොහොත්* හෙක්ටයාර් 4.8731 ක බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගස කොළ, වැවිලි හා වෙනත් සියලු දේ.

04. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට් සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නැමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 06 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට සහ උතුරු-බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ ලෙච්චමනන් හිමිකම් කියන විලන වත්ත ද, දකුණට සහ දකුණු-බස්නාහිරට : ධර්මපාල හිමිකම් කියන අන්ගෙකුඹුර සහ රාමලිංගම් හිමිකම් කියන වහුගෙතැන්න වත්ත ද යන මායිම් ඇතුළත එකී පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් විස්සක් (අ.0, රූ.3, පර්.20) *නොහොත්* හෙක්ටයාර් 0.3546 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගස කොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

05. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට් සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 07 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරු-නැගෙනහිරට : ඇළ ද, දකුණු-නැගෙනහිරට : ෂෙල්ටන් සේනාරත්න හිමිකම් කියන විලනඑස්ටේට් වත්ත ද, දකුණු-බස්නාහිරට සහ උතුරු-බස්නාහිරට : අලවතුගොඩ-අංකුඹුර ප්‍රධාන පාරට යන ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් ඇතුළත එකී පිඹුර ප්‍රකාර පර්චස් තිස්හතරක (අ. 0, රූ.0, පර්. 34) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

06. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට් සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 08 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : විලන පන්සලට අයිති විලන වත්ත ද, ජයසිංහ හිමිකම් කියන විලනවත්ත, තිලකරත්න හිමිකම් කියන අඳපොලවත්ත හා ප්‍රේමදාස හිමිකම් කියන නැගොල්ල හේන ද, සුමනදාස සහ තවත් අය හිමිකම් කියන ගොඩගොමතැන්න සහ විලියම් හිමිකම් කියන කුඹුර ද, නැගෙනහිරට : විලන පන්සලට අයිති විලනවත්ත, ප්‍රේමදාස හිමිකම් කියන නැගොල්ලහේන ද, සුමනදාස සහ තවත් අය හිමිකම් කියන ගොඩගොමතැන්න, විලියම් හිමිකම් කියන කුඹුර සහ ඩබ්ලිව්. ජී. ගුණපාල සහ තවත් අය හිමිකම් කියන ගොඩගොමතැන්න වත්ත ද, දකුණට : හීන්කොල්ලා සහ තවත් අය හිමිකම් කියන විලනවත්ත වෙන් වන පැළ ඉණි වැට, ඉහත කී පිඹුරේ ලොට් 09 වෙන් වන අඩිපාර සහ සිරිසෝම සහ තවත් අය හිමිකම් කියන විලන වත්ත වෙන්වන ඇළ ද, බස්නාහිරට : ඔය ද, උතුරු - බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර සහ අඩි පාර ද යන මායිම් ඇතුළත එකී පිඹුර ප්‍රකාර අක්කර තිස්හතරකුත් රූඩ් තුනකුත් පර්චස් අටක් (අ.34, රූඩ්03, පර්.08) *නොහොත්* හෙක්ටයාර් 14.0828 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි හා එහි පිහිටි සියලු දේ.

07. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජූනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික

කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, "විලන එස්ටේට් සහ "වොල්ස්එන්ඩ් එස්ටේට්" නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 10 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට කුඹුරේ වනාත සහ ඩී. ජී. හේමානන්ද හිමිකම් කියන ගලගාව කලුපැකිර හේන ද, නැගෙනහිරට ඩී. ජී. හේමානන්ද හිමිකම් කියන ගලගාව කලුපැකිර හේන වෙන්වන පැළ ඉනි වැට ද, දකුණට : අලවතුගොඩ සිට අංකුඹුරට යන මහ පාර හා ඉහත කී පිඹුරේ පෙන්නුම් කර තිබෙන පාර සහ බස්නාහිරට කුඹුරේ වනාත ද යන මායිම් ඇතුළත එකී පිඹුර ප්‍රකාර අක්කර එකකුත් රූඩ් දෙකකුත් පර්චස් දහසයක් (අ.01, රූ.02, පර්.16) නොහොත් හෙක්ටයාර් 0.6485 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි හා එහි පිහිටි සියලු දේ.

08. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජුනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, “විලන එස්ටේට්” සහ “වොල්ස්එන්ඩ් එස්ටේට්” නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 11 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංකුඹුර සිට අලවතුගොඩට යන මහ පාර ද, දකුණු-නැගෙනහිරට : ජී. ජී. කමලාවතී සහ තවත් අය හිමිකම් කියන පොල්ගහංගේ වත්ත වෙන්වන ඉවුර (bank) ද, දකුණට : වත්තේ සිට ප්‍රධාන පාරට යන ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : ඒ. ජී. ගුණපාල හිමිකම් කියන අම්පිටියේ ගෙදරවත්ත සහ උතුරු-බස්නාහිරට : ඒ. ජී. ප්‍රේමදාස හිමිකම් කියන අම්පිටියේ ගෙදරවත්ත වෙන් වන පැළ ඉණි වැට ද යන මායිම් ඇතුළත එකී පිඹුර ප්‍රකාර අක්කර තුනකුත් රූඩ් දෙකකුත් පර්චස් තිස් එකක (අ. 03, රූ.02, පර්.31) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

09. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩගම්පහ කෝරළේ, විලන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් මැන සකස් කළ අංක 1169 හා 1955 ජුනි 30 දින දරන පිඹුරේ දැක්වෙන සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 967 හා 968 සහ 1968 අගෝස්තු 31 දින දරන ඔප්පුවල විස්තර කර තිබෙන, “විලන එස්ටේට්” සහ “වොල්ස්එන්ඩ් එස්ටේට්” නමැති වතුවලින්, බලයලත් මිනින්දෝරු සුසිරි ඒකනායක විසින් මැන සකස් කළ අංක 2887 හා 2004 සැප්තැම්බර් 30 වැනි දින සිට 2004 නොවැම්බර් 15 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 12 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : වත්තේ සිට ප්‍රධාන පාරට යන ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට නිමල් චන්ද්‍රසේන හිමිකම් කියන දේල්ගස්පිල්ලඅංග වත්ත ද, දකුණට : නිවෙස්වලට යන පාර, ජී. ජී. ජයරත්න හිමිකම් කියන පොල්ගහඅංග වත්ත, නිමල් චන්ද්‍රසේන හිමිකම් කියන දෙල්ගස්පිල්ලඅංග ද, බස්නාහිරටඃ ප්‍රාදේශීය සභා පාරේ සිට නිවෙස් වලට යන පාර ද සහ ජී. ජී. ජයරත්න හිමිකම් කියන පොල්ගහඅංග වත්ත ද යන මායිම් ඇතුළත, ඉහත කී පිඹුර ප්‍රකාර අක්කර එකකුත් පර්චස් විසි එකක් (අ. 01, රූ. 0, පර්. 21) නොහොත් හෙක්ටෙයාර් 0.4588 බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-308/2

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ඩබ්ලිව්. ඒ. ආර්. අතුල ප්‍රනාන්දු සහ එච්. එස්. අනුරලතා ප්‍රනාන්දු

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම් වික්‍රම ආරච්චිගේ රොහාන් අතුල ප්‍රනාන්දු සහ හිනිදුමගේ ශ්‍රියාණි අනුරලතා ප්‍රනාන්දු බන්ධනදායියන් වශයෙන් ද වික්‍රම ආරච්චිගේ රොහාන් අතුල ප්‍රනාන්දු උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දෙලුක්ෂි වැරනි එගොඩගේ විසින් ලියා සහතික කරන ලද අංක 335 සහ 2006 ජනවාරි මස 23 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2009.05.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස් හතර ලක්ෂ පනස් පන්දහස් හාරසිය අසූපහයි ශත හතක (රු. 34,55,485.07) මුදල සහ 2009.06.01 දින සිට රුපියල් ලක්ෂ විසිහතක (රු. 27,00,000) මුදල මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොළිය ද, රුපියල් ලක්ෂ විසිහත (රු. 27,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 335 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් තිස් හතර ලක්ෂ පනස්පන් දහස් හාරසිය අසූ පහයි ශත හතක (රු. 34,55,485.07) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, ඉහල බියන්විල පිහිටි ඔරේන්ජ් බිල් වත්ත හෙවත් මැඩෝනා

ඩෙල් ෆ්ලෝරේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 5052 සහ 1988 පෙබරවාරි මස 03 වැනි දිනැති සැලැස්මේ දැක්වෙන ලොට් 86 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් 68, නැගෙනහිරට : ලොට් 87, දකුණට : ලොට් 94 සහ 93 සහ බස්නාහිරට : ලොට් ආර් 7 යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු වැවිලි ආදී සියලු දේ වේ. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 612/247හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 5052 දරන සැලැස්මේ ලොට් ආර්7, ආර්13, ආර්2 සහ ආර්3 යන පාර සඳහා වූ වෙන් කිරීම මත මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/4

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - රත්නපුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : මාපිටියගේ දොන් අමිල ෂිරන්ත සහ මාපිටියගේ දොන් ලයනල් වසන්ත.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්. මාපිටියගේ දොන් අමිල ෂිරන්ත සහ මාපිටියගේ දොන් ලයනල් වසන්ත බන්ධනදායීයන් වශයෙන් ද මාපිටියගේ දොන් අමිල ෂිරන්ත උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එස්. පී. කේ. සුහසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 50 සහ 2009 ජූනි මස 19 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.10.29 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හතලිස් හයලක්ෂ විසිපන්දහස් හාරසිය හැට අටයි ශත විසිපහක (රු. 46,25,468.25) මුදල සහ 2009.10.03 දින සිට රුපියල් හතලිස් හතරලක්ෂ පනස් නමදහස් හත්සිය දාහතයි ශත අනූපහක (රු. 44,59,717.95) මුදල මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 50 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හතලිස් හයලක්ෂ විසිපන්දහස් හාරසිය හැට අටයි ශත විසිපහක (රු. 46,25,468.25) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, උඩුගහපත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කහපොළ ගමෙහි පිහිටි මිල්ලගහලන්ද නමැති ඉඩමේ කොටසකට බලයලත් මානක එච්. ලාල් ගුණසේකර විසින් මැන සාදන ලද අංක 2549 සහ 1988 අප්‍රේල් මස 2 වැනි දිනැති සැලැස්මේ ලොට් 7 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : අංක 2549 සැලැස්මේ ලොට් 5, නැගෙනහිරට : අංක 2549 සැලැස්මේ ලොට් 6, දකුණට : පාර සහ බස්නාහිරට : කේ. එඩ්වින් පෙරේරා හිමිකම් කියන මිල්ලගහවත්ත යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම එකයි පහක (අ. 0, රූ. 0, පර්. 14.15) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් ඇතුලු සියලු දේ ද වේ. හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 429/160 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 2549 සැලැස්මේ ලොට් 8 මත මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/5

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ඩී. ඩී. කේ. රයිස් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

එනම් ඩී. ඩී. කේ. රයිස් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් ද යසසිරි කස්තුරිආරච්චි උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්

චතුරිකා විජේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 485 සහ 2004 අප්‍රේල් මස 29 සහ අංක 527 සහ 2004 සැප්තැම්බර් මස 06 වැනි දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත,

(අ) 2009.02.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් විසිඅට ලක්ෂ හයදහස් පන්සිය තිස් අටයි ශත අනූ අට (රු. 28,06,538.98)ක මුදල සහ 2009.02.01 දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් විසිපන් ලක්ෂයක (රු. 25,00,000) මුදල මත වර්ෂයකට 25.5% බැගින් පොළිය ද සහ රුපියල් විසිපන් ලක්ෂය (රු. 25,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට 38% බැගින් පොළිය ද,

(ආ) 2009.02.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ දහසය දහස් නමසිය පනස් හතරයි ශත තුනක (රු. 16,16,954.03) මුදල සහ 2009.02.24 දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දාහතර ලක්ෂ හැටතුන් දහස් හයසිය හතලිස් හතරයි ශත හැට හතරක (රු. 14,63,644.64) මුදල මත වර්ෂයකට 29%බැගින් පොළිය ද,

(ඇ) 2009.02.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් එකලොස් ලක්ෂ තුන්දහස් හාරසිය අනූඅටයි ශත හැත්තෑ නමයක (රු. 11,03,498.79) මුදල සහ 2009.02.24 දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් තුන්සිය විස්සක (රු. 8,33,320) මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද,

(ඈ) 2009.02.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හත්ලක්ෂ හත් දහස් පනහයි ශත හතලිස් පහක (රු. 7,07,050.45) මුදල සහ 2009.02.24 දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් පන්ලක්ෂ තිස්අට දහස් පන්සිය හතලිස් එකයි ශත හතලිස් දෙකක (රු. 5,38,541.42) මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 485 සහ 527 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් හැටදෙලක්ෂ තිස්හතර දහස් හතලිස් දෙකයි ශත විසිපහක (රු. 62,34,042.25) මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474, මහානාම ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර රංජිත් එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හාපිටිගම් කෝරළයේ, යටිගහ පත්තුවේ, බටලීය සහ මුරුතවල ගම් හි පිහිටි මුරුතවලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 1192 සහ 1999 ජූලි මස 25 දිනැති සැලැස්මේ ලොට් 1A වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : අංක 10453 සැලැස්මේ ලොට් 1හි ඉතිරි කොටස, නැගෙනහිරට : අංක 10453 සැලැස්මේ ලොට් 1හි ඉතිරි කොටස, දකුණට : අංක 10453 සැලැස්මේ ලොට් 1හි ඉතිරි කොටස සහ බස්නාහිරට : ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර පහක (අ. 5, රූ. 0, පර්. 0) විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ වෙනත් දියුණු කිරීමේ ආදිය වේ. මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී329/135හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/6

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - දෙහිවල ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : පැකේජිං මැනුෆැක්චරින් සොලුයුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්. පැකේජිං මැනුෆැක්චරින් සොලුයුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නීල් රාජකරුණා හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 1754 සහ 2009 මැයි මස 04 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.10.29 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ තිස් දෙදහස් හත්සිය හැට දෙකයි ශත පහ (රු. 6,32,762.05)ක මුදල සහ 2009.10.30 දින සිට රුපියල් හයලක්ෂ විසි දෙදහස් තුන්සිය හැත්තෑහතයි ශත හැත්තෑ දෙක (රු. 6,22,377.72) ක මුදල මත වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 1754 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හයලක්ෂ තිස් දෙදහස් හත්සිය හැට දෙකයි ශත පහ (රු. 6,32,762.05) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද, අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොරතොට පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. විරසිංහ විසින් මැන සාදන ලද අංක 1539 සහ 1998 දෙසැම්බර් මස 16 දිනැති සැලැස්මේ ලොට් 6 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ද ෆිනෑන්ස් කොම්පැනිය හි වෙන්දේසිවත්ත, නැගෙනහිරට : ලොට් 46, දකුණට : ලොට් 7 සහ බස්නාහිරට : ලොට් 39 යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හතරයි හතර (අ. 0, රූ. 0, පර්. 10.44) ක් විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1859/122 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 1539 සහ 1998 දෙසැම්බර් මස 16 දිනැති සැලැස්මේ ලොට් 44, 38 සහ 39 මත මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/3

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - රත්නපුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : මාපිටියගේ දොන් අමිල ෂිරන්ත සහ මාපිටියගේ දොන් ලයනල් වසන්ත.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම් මාපිටියගේ දොන් අමිල ෂිරන්ත සහ මාපිටියගේ දොන් ලයනල් වසන්ත බන්ධනදායීයන් වශයෙන් ද, මාපිටියගේ දොන් අමිල ෂිරන්ත උකස්කරු වශයෙන් ද, කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එස්. පී. කේ. සුභසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 52 සහ 2009 ජුනි මස 19 වැනි දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.10.29 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හැටතුන් ලක්ෂ අසූහය දහස් හයසිය පනස් හයයි ශත හැටඑකක (රු. 63,86,656.61) මුදල සහ 2009.10.03 වැනි දින සිට රුපියල් හැටඑක් ලක්ෂ අනූඑක් දහස් නමසිය හැටපහයි ශත දහතුන (රු. 61,91,965.13) ක මුදල මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 52 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැටතුන් ලක්ෂ අසූහය දහස් හයසිය පනස් හයයි ශත හැටඑක (රු. 63,86,656.61) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද, අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකන්දන පිහිටි කොස්ගහලන්ද හෙවත් ජම්බුගහවත්ත ඉඩමෙන් කොටසකට බලයලත් මානක ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් මැන සාදන ලද අංක 941 සහ 1981.11.08 දිනැති සැලැස්මේ ලොට් 11 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : බැස්ටියගේ දොන් නෝර්නිස් සිංඤෝ විසින් හිමිකම් කියන ඉඩම වෙන් කරන ජීව් වැට, නැගෙනහිරට : එකී සැලැස්මේ ලොට් 12, දකුණට : පාර සහ බස්නාහිරට : එකී සැලැස්මේ ලොට් 5 සහ පාරක් වශයෙන් ලකුණු කර ඇති ලොට් 6 යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් ඇතුලු සියලු දේ ද වේ. දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1387/272 යටතේ ලියාපදිංචි කර ඇත.

මෑතකදී කරන ලද යලි මැණුමක් අනුව ඉහත කී ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකන්දන පිහිටි ජම්බුගහවත්ත ඉඩමෙන් කොටසකට බලයලත් මානක ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් මැන සාදන ලද අංක 941 සහ 1981.11.08 දිනැති සැලැස්මේ ලොට් 11 දරන බිම් කොටස බලයලත් මානක සිරි බොපේ ආරච්චි විසින් නැවත මනින ලදුව අංක 4701 සහ 2007.09.26 සැලැස්මේ ලොට් 1 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : එම්. ඩී. නෝර්නිස් සිංඤෝ සහ තවත් අය හිමිකම් කියන ජම්බුගහවත්ත, නැගෙනහිරට : බී. ඩී. ජී. රූබන් හිමිකම් කියන බලයලත් මානක ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් මැන සාදන ලද අංක 941 සැලැස්මේ ලොට් 12, දකුණට : සර්වෝදය

මාවත සහ බස්නාහිරට ෘ අංක 941 සැලැස්මේ ලොට් 5 සහ 6 යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් ඇතුලු සියලු දේද වේ. දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3130/221 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 941 සැලැස්මේ ලොට් 6 මත මාර්ග අයිතියද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/2

---

### පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

